# ප්‍රවෘත්ති නිවේදනය

**"ජූලි මාසයේදී ද උද්ධමනය 6.3%ක් ලෙස නොවෙනස්ව පැවතුණි"**

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2017 ජූලි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2017 ජුනි මාසයේ වාර්තා වූ පරිදිම 2017 ජූලි මාසයේදී ද ලක්ෂ්‍යමය උද්ධමනය 6.3%ක් වූ බව ප්‍රකාශ කලේය. 2017 ජූලි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 3.7%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.6%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 ජුනි මාසයේ උද්ධමනය සඳහා මෙම එක් එක් කාණ්ඩයේ දායකත්වය පිළිවෙලින් 3.9%ක් හා 2.4%ක් විය.

කෙසේ නමුත් 2017 ජූලි මාසයේ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කළවිට, 2017 ජුනි මාසයේ දර්ශකය 123.4 සිට 2017 ජූලි මාසයේ දර්ශකය 122.4 දක්වා පහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කල විට 2017 ජූලි මාසයේ මෙම අඩුවීම 1.0ක දර්ශකාංක අඩුවීමක් හා 0.8ක ප්‍රතිශතකාංක අඩුවීමක් ලෙස වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.90%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.06%කින් වැඩිවීම බලපා ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා එළවළු, අළුත් මාළු, පොල්, මයිසූර් පරිප්පු, රතුළූණු, ලොකු ළූණු, අමු මිරිස්, පොල් තෙල් සහ සුදුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් සහල්, වියළි හාල්මැස්සන්, බිත්තර, කෙසෙල් සහ තේ කොළ යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සසඳන කල 2017 ජූලි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ප්‍රවාහන', 'විවිධ භාණ්ඩ හා සේවා', 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. එමෙන්ම 'ආපනශාලා හා හෝටල්' යන කාණ්ඩයේ වියදම්වල වටිනාකමෙහි සුළු වැඩිවීමක් වාර්තා වේ. එසේ වුවත් 2017 ජුනි මාසය හා සංසන්දනය කළවිට 'සෞඛ්‍ය' කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවී ඇත. 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'සන්නිවේදන, 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2016** | ජූලි | 115.2 | -0.8 | 5.8 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 |
| | ඔක්තෝම්බර් | 114.7 | 1.1 | 5.0 |
| | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 |
| | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 |
| **2017** | ජනවාරි | 119.3 | 1.1 | 6.5 |
| | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 |
| | මාර්තු | 119.5 | -0.3 | 8.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 |
| | ජූනි | 123.4 | 1.3 | 6.3 |
| | ජූලි | 122.4 | -0.8 | 6.3 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව